Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 43 S

චිත්‍ර I පත්‍රය

කාලය පැය දෙකයි

නම ..............................................

( I - II කොටස් 2 කි).

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

- පහත ඡායාරූපයේ දැක්වෙන්නේ පොළොන්නරුව ගල් විහාරයේ බුද්ධ ප්‍රතිමාවකි. එය උපයෝගී කරගෙන ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



1. මෙම බුදු පිළිමයෙහි දැක්වෙන මුද්‍රාව කුමක් ද? ..........................................................................
2. පිළිමය නෙළීමේ දී එයට යොදා ඇති ආසනය නම් කරන්න...................................................................
3. පිළිමයෙහි දැක්වෙන ආසන ක්‍රමය නම් කරන්න ..........................................................................
4. මෙම විහාරයේ ඇති හිටි බුද්ධ ප්‍රතිමාවේ මුද්‍රාව නම් කරන්න.
   ..................................................................................
5. ඉහත අංක 1 හි පිළිතුරෙහි සඳහන් මුද්‍රාවෙන් (ඉහත රූපයෙහි) ප්‍රකාශිත වන අර්ථය කුමක් ද?
   ..................................................................

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.

6. කෝලම් රටා ..........................................................................................................
   ..........................................................................................................
7. පේසා වළලු ..........................................................................................................
   ..........................................................................................................
8. පර්යාවලෝකය ..........................................................................................................
   ..........................................................................................................
9. ගෝපුරම් ..........................................................................................................
   ..........................................................................................................
10. මස්ජිදය ..........................................................................................................
    ..........................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

11. ප්‍රථම දෙවොල් මඩු ශාන්ති කර්මය රුවන්වැල්ල ආශ්‍රිතව පැවැත් වූ බව සඳහන් වන්නේ,
    1. පත්තිනි දෙවඟන මුල් කර ගෙන යි
    2. ගණ දෙවියන් මුල් කරගෙන යි
    3. කොහොඹා දෙවියන් මුල් කර ගෙන යි
    4. විෂ්ණු දෙවියන් මුල් කර ගෙන යි

12. හින්දු කෝවිල් ආශ්‍රිතව පවත්වනු ලබන ශාන්ති කර්මය වන්නේ,
    1. පහන් මඩු ශාන්ති කර්මය යි
    2. කුම්බාබිෂේකම් ශාන්ති කර්මය යි
    3. දෙවොල් මඩු ශාන්ති කර්මය යි
    4. කොහොඹා කන්කාරි ශාන්ති කර්මය යි

13. රූකඩ කලාව ලංකාවේ අතීතයේ සිට පැවත එන ජනප්‍රිය කලාවකි. එදා මේ සඳහා වැඩි වශයෙන් භාවිතා කර ඇත්තේ,
    1. රිටි රූකඩ වේ
    2. නූල් රූකඩ වේ
    3. අත් රූකඩ වේ
    4. සෙවනැලි රූකඩ වේ

14. අතීතයේ වටදාගෙයක් තිබූ බවට දාගැබ වටා දැනට ශේෂව ඇති ගල් කණු මගින් හඳුනා ගත හැකිය. එසේ හඳුනා ගෙන ඇති ස්ථානයකි.
    1. අභයගිරි විහාරය
    2. රන්කොත් වෙහෙර
    3. ථූපාරාමය
    4. ජේතවනාරාමය

15. පැදුරු කර්මාන්තයේ දී පන් හා නියද වර්ණ කර ගැනීමේ දී "රතු" වර්ණය සාදා ගැනීමට යොදා ගනු ලබන්නේ,
    1. වෙනිවැල්ගැට වේ
    2. පතඟි දැව වේ
    3. අරළු බුළු වේ
    4. කනේරු කොළ වේ

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා රූපසටහන්වල ඇති මුද්‍රාවන් නම් කරන්න.



16. ................................



17. ............................................



18. ........................................



19. ..........................................



20. ............................................

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා අසා ඇති ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.

21. ඉන්දියාවේ සාංචි ස්තූපයේ "හර්මිකාව" නමින් හඳුන්වන කොටස ශ්‍රී ලංකාවේ චෛත්‍යවල හඳුන්වන්නේ කිනම් නමකින් ද? ..........................................................

22. කෑගලු දිස්ත්‍රික්කයේ මල්දෙණිය වතුයායේ පිහිටා ඇති "දොරවක" ලෙනෙන් හමු වී ඇති සිතුවම් අයත් වන්නේ ශ්‍රී ලංකාවේ කුමන යුගයකට ද? ..........................................................

23. පාලි භාෂාවෙන් "කුමුදුප්පල" ලෙස ද සිංහල භාෂාවෙන් "දිව මානෙල්" ලෙස ද හඳුන්වන සිංහල සැරසිලි අතර ඇති අලංකාර මල හඳුන්වන නම කුමක් ද? ..........................................................

24. කහ වර්ණය සහ රතු වර්ණය සමානුපාතිකව එකතු කිරීමෙන් ද්විතීයික වර්ණයක් සෑදේ. එම ද්විතීයික වර්ණය නම් කරන්න. ..........................................................

25. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දේවස්ථාන නිර්මාණ ශෛලීන් දෙකකට අනුව නිර්මාණය විය. "රෝමන් ක්‍රමයේ දේවස්ථාන" එයින් එක් ක්‍රමයකි. අනෙක් ක්‍රමය හඳුන්වන්න. ..........................................................

- පහත ඡායාරූපයේ දැක්වෙන ස්තූපය හඳුනාගෙන ඒ ඇසුරෙන් ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



26. ඉහත රූපයෙහි දැක්වෙන ස්තූපය නම කුමක් ද? ..........................................................................

27. මෙම ස්තූපය කරවීම සඳහා මූලික වූ බව සඳහන් වන රජතුමා කවු ද? ..........................................

28. ස්තූප හැඩ අනුව මෙහි ඇති හැඩය කුමක් ද? ..........................................................................

29. මෙම චෛත්‍ය වටා ඇති පවුර විශිෂ්ට නිර්මාණයකි. එය හඳුන්වන නම කුමක් ද? ..........................................................................

30. මෙම දාගැබ අයත් වන්නේ කිනම් යුගයකට ද? ..........................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පළමු වාර පරීක්ෂණය - 2019
# චිත්‍ර කලාව

## 8 ශ්‍රේණිය

II - කොටස

- පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.
- චිත්‍රය පසුපිටෙහි ඔබේ නම හෝ විභාග අංකය, ශ්‍රේණිය හා මාතෘකාවේ නම පැහැදිළිව ලියන්න.

01. අවමංගල උත්සව අවස්ථාවක් හෝ වෙනත් දුක්බර මොහොතක්
02. ශ්‍රමදානයක යෙදෙන මිනිසුන් පිරිසක්
03. පොරබදන සතුන් දෙදෙනෙක්
04. දිය කඩිත්තක් අසලට රැස් වූ මුව රංචුවක්
05. නිර්ජීවී හෝ දිව්‍ය ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි ඒකක භාවිත කරමින් සාරි වාටියක් සැරසිලි කරන්න
06. පාසලේ පැවැත්වෙන "නිවාසාන්තර ක්‍රීඩා උළෙල" සඳහා වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# පළමු වාර පරීක්ෂණය - 2019
# 8 ශ්‍රේණිය චිත්‍ර කලාව (පිළිතුරු පත්‍රය)

I - කොටස

01. ධ්‍යාන මුද්‍රාව
02. වජ්‍රාසනය
03. වීරාසන
04. පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව
05. ධ්‍යානයකට සමවැදී සිටින ආකාරය
06. හින්දු භක්තිකයින් තම උත්සවවලදී වර්ණ කුඩු යොදා ගෙන ගෙම්දුලෙහි අඳිනු ලබයි. (ප්‍රශ්නයට අදාළව ගැලපෙන පිළිතුරට ලකුණු ලබා දෙන්න).
07. දාගැබක පහළ කොටසෙහි වළලු තුනකින් සැදුනු කොටස / තුන් මහල් පේශාව නමින් ද මෙය හඳුන්වයි.
08. වස්තුවක් දුරින් පිහිටීම දැක්වීමට කුඩාවටත්, ළඟින් පිහිටීම දැක්වීමට විශාලවත් ඇඳීම / ළඟ දුර පෙන්වා ඇඳීම
09. හින්දු කෝවිලක ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය මෙයයි. පිවිසුම් දොරටුවට ඉහළින් මූර්තිමය නිර්මාණ රැසකින් මෙය නිර්මාණය වී ඇත.
10. ඉස්ලාම් (මුස්ලිම්) පල්ලිය මේ නමින් හඳුන්වයි.

11. (1) 12. (2) 13. (2) 14. (2) 15. (2)

16. ධම්මචක්ක මුද්‍රාව
17. කටක හස්ත මුද්‍රාව
18. භූමි ස්පර්ශ මුද්‍රාව
19. අභය මුද්‍රාව
20. වරද මුද්‍රාව

21. හතරැස් කොටුව
22. ප්‍රාග් ඓතිහාසික යුගයට
23. කඩුපුල් මල
24. තැඹිලි වර්ණය
25. ගොතික් ක්‍රමය
26. රුවන්වැලිසෑය
27. දුටුගැමුණු රජතුමා
28. බුබ්බුලාකාර
29. ඇත් පවුර
30. අනුරාධපුර යුගය

⦿ එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 30

⦿ II කොටස සඳහා ලකුණු 70 යි.